# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1890/2 - 2014 නොවැම්බර් මස 24 වැනි සඳුදා - 2014.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2015 ජනවාරි මස 08 වැනි දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය පිළිබඳව විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය විසින් පිළිපැදිය යුතු මාධ්‍ය උපමාන**

හැඳින්වීම

ගුවන් විදුලිය, රූපවාහිනිය හා මුද්‍රිත මාධ්‍ය මගින් අදහස් ප්‍රකාශ කිරීම හා තොරතුරු වාර්තා කිරීම, නිවැරදිව සහ අපක්ෂපාතීව සිදු කිරීම ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් සංකේතයක් මෙන්ම මූලික ලක්ෂණයක් ද වේ. මාධ්‍ය ආයතන තම නිදහස භාවිතා කරන ආකාරය, සමස්තයක් ලෙස සමාජයට සහ ජනතාවට සේවය කිරීම උදෙසා ම විය යුතු ය. මාධ්‍ය ආයතනවල කටයුතු වෘත්තීය මට්ටමින් පවත්වාගෙන යාමට සහ ශ්‍රවනය කරන්නන්ගේ, පාඨකයන්ගේ සහ ප්‍රේක්ෂකයන්ගේ අයිතිවාසිකම් ගරු කොට සැලකිය යුතු ය. ජනතාවගේ දෛනික ජීවිතයට ගරු කොට තොරතුරු, අධ්‍යාපනික සහ විනෝදාත්මක වැඩසටහන් ඉදිරිපත් කළ යුතු ය. මහජනතාවට වැදගත් වන කරුණු ගැන සාකච්ඡා සහ වාද විවාද සාධාරණ අන්දමින් පැවැතිය යුතු ය. එසේම පුවත් වාර්තා කිරීම සහ කතු වැකි ඉදිරිපත් කිරීම ද අපක්ෂපාතී වීම වැදගත් වේ.

මතභේදාත්මක ගැටළු ගැන අදහස් ප්‍රකාශ කිරීමේ දී ගැටළුවේ ප්‍රතිවිරුද්ධ පැති දෙකම නියෝජනය විය යුතු ය. එවැනි ගැටළු සම්බන්ධයෙන් තම අදහස් ප්‍රකාශ කිරීමට පුද්ගලයන්, පක්ෂ සහ සංවිධාන විසින් අවස්ථාවක් ඉල්ලුම් කළ විට, එවැනි ඉල්ලීම්වලට ප්‍රමාණවත් කාලයක්/ඉඩක් දීම සලකා බැලිය යුතු ය.

ප්‍රජාතාන්ත්‍රවාදී ක්‍රියාදාමය තුළ මහජනතාවගේ සහභාගිත්වය ධෛර්යමත් කිරීමට සහ විවිධ කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරණ අපේක්ෂකයන්ට දැනුවත් වීමට ඇති අවස්ථාව සුරක්ෂිත කිරීමට, මැතිවරණ කාලසීමාව තුළ මාධ්‍ය සතුව විශේෂ වගකීමක් ඇත.

ඉහත සඳහන් අපේක්ෂාවන් පෙරදැරි කරගෙන, පැවරී ඇති බලතල පරිදි ඉදිරියේ දී පැවැත්වෙන ඡන්ද විමසීම් කාලය තුළ දී මාධ්‍ය ආයතන විසින් පිළිපැදිය යුතු උපමාන පහතින් සඳහන් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ අටවන සංශෝධනයෙන් සංශෝධිත වූ දහහත්වන ව්‍යවස්ථා සංශෝධනයේ 104 (ආ) (5) (අ) අනු ව්‍යවස්ථාව සහ මැතිවරණ පැවැත්වීමට අදාළ වෙනත් නීති රීති යටතේ මැතිවරණ කොමසාරිස්, මහින්ද දේශප්‍රිය වන මට පැවරී ඇති බලතල, වගකීම් සහ කාර්යය භාරය අනුව නිදහස්, ස්වාධීන හා රහස්‍ය ඡන්ද විමසීම් පැවැත්වීම සහතික කිරීම සඳහා සියලුම මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන් විසින් පිළිපැදීම සඳහා පහත සඳහන් උපමාන මෙයින් නිකුත් කරමි.

1. ප්‍රවෘත්ති පත්‍රවල ඉඩ වෙන්කර දීමේ දී හෝ ගුවන් කාලය ලබා දීමේ දී කිසිම අපේක්ෂකයකුට හෝ පක්ෂ නායකයකුට හෝ වෙනස්කම් නොකළ යුතු අතර ජනාධිපතිවරණය පිළිබඳව වාර්තා කිරීමේ දී සියලුම මුද්‍රිත, රූපවාහිනී සහ ගුවන් විදුලි මාධ්‍ය ආයතන සමතුලිතතාවයක් හා අපක්ෂපාතිත්වයක් දැක්විය යුතු ය ;

2. ප්‍රවෘත්ති විකාශය සහ වත්මන් තතු විකාශය කිරීමේ දී සියලුම මාධ්‍ය ආයතන නිවැරදි, සමතුලිත සහ අපක්ෂපාති විය යුතු ය ;

3. ප්‍රවෘත්ති පත්‍රවල කර්තෘ අදහස් ව්‍යාකූල මෙන්ම සමබර නොවීමට ඉඩ ඇති බැවින් කර්තෘ අදහස් විද්‍යුත් මාධ්‍ය විසින් විකාශය නොකළ යුතු ය. එසේ නමුදු කිසියම් හේතුවක් නිසා කර්තෘ අදහස් විකාශය කළහොත් ඊට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටියහොත් එම කරුණු විකාශය කිරීමට බැඳී සිටිය යුතු ය ;

4. ඡන්ද විමසීම් කාලය තුළ දී සමතුලිතභාවය නොමැති වැඩසටහන් විකාශය නොකිරීමට සියලුම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති අංශ හා වත්මන් තොරතුරු විකාශය භාර අංශවල වගකීම වේ ;

5. යම් සිද්ධියක් හෝ සිදුවීමක් පිළිබඳව කරුණු විකාශය කිරීමේ දී යම් අපේක්ෂකයකුගේ අදහස් ඉදිරිපත් කරන විට එම කරුණ ගැන උනන්දුවක් හෝ සැලකිල්ල දක්වන හෝ එම කරුණු මගින් බලපෑමක් ඇති විය හැකි අනෙකුත් පක්ෂවලට එම ප්‍රවෘත්ති විකාශයේ දීම හෝ වැඩසටහනේ දීම හෝ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසා දිය යුතු ය. එදිනම ඒ අවස්ථාව ලබා දිය නොහැකි නම් එයට පසුදින හෝ ඒ සඳහා අවස්ථාව දිය යුතු ය ;

6. ඕනෑම වාර්තාමය වැඩසටහනක් හෝ විශේෂ වැඩසටහනක් හෝ ඡන්ද විමසීම් සමයේ දී විකාශය කිරීමේ දී පිටපත්කරු, නිවේදක හා සංස්කාරකගේ නම සඳහන් කළ යුතු ය ;

7. පෙර අවස්ථාවල දී විකාශය කළ හෝ පළකළ සාකච්ඡා, වාද විවාද සහ එබඳු වැඩසටහන් ඡන්ද විමසන දිනට පූර්වයෙන් යෙදෙන පැය 48 කාලය තුළ දී නැවත විකාශය කිරීම හෝ පළ කිරීම සිදු නොකළ යුතු ය ;

8. ජනාධිපතිවරණය අවසන් වනතුරු ජනාධිපතිවරණයට තරඟ කරනු ලබන අපේක්ෂකයන්ට විරුද්ධව ඔප්පු කිරීමට නොහැකි චෝදනා ප්‍රවෘත්ති ප්‍රකාශනවල දී හෝ වැඩ සටහන්වල දී ප්‍රචාරය නොකළ යුතු ය ;

9. රාජකාරිමය උත්සව සහ අපරාධ ආදී ඡන්ද විමසීම මත අදාළ නොමැති ප්‍රවෘත්ති විසුරුවා හැරීමේ දී වුව ද එමගින් කිසියම් අපේක්ෂකයකුට ප්‍රතිලාභයක් හෝ අගතියක් සිදු නොවන බවට සියලුම මාධ්‍ය ආයතන සුපරීක්ෂාකාරී විය යුතු ය ;

10. ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ රජයේ අමාත්‍යවරු සම්බන්ධ වන දේශපාලන මත/අදහස් ප්‍රකාශ කිරීමේ රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහන්වල ඔහු/ඇය අයත් වන දේශපාලන පක්ෂයේ වැඩ සටහනක් ලෙස සැලකිය යුතු අතර, එම නිසා එයට විරුද්ධ අදහස් දරන දේශපාලන පක්ෂවල නායකයන්ට ද ඒ හා සමාන වැඩ සටහන් ලබා දිය යුතු ය. මුද්‍රිත මාධ්‍ය ද ඒ අයුරින් දේශපාලන පක්ෂවලට විශේෂ සාකච්ඡා ලබා දීමේ දී පක්ෂ රැස්වීම් වාර්තා පළ කිරීමේ දී සමාන ඉඩක් හා ප්‍රමුඛතාව ලබා දිය යුතු ය ;

11. යම් අපේක්ෂකයකුට විශේෂ සැලකිල්ලක් දක්වා ප්‍රවර්ධනය වන අයුරින් හෝ වෙනත් අපේක්ෂකයන් හට අගතියක් වන අයුරින් හෝ ගුවන් කාලය නැතහොත් ප්‍රවෘත්ති පත්‍ර ඉඩකඩ වෙන් කිරීම නොකළ යුතු ය ;

12. ඡන්ද විමසීමට ඉදිරිපත් වී ඇති අපේක්ෂකයකු ප්‍රවර්ධනය කෙරෙන සේ රාජ්‍ය නිලධාරීන් විසින් පවත්වන දේශන, සම්මුඛ සාකච්ඡා ආදිය ප්‍රචාරය කිරීමෙන් සියලුම මාධ්‍ය වැළකී සිටිය යුතු ය.

13. කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගීවන්නන් තෝරා ගැනීමේ දී සියලුම විද්‍යුත් මාධ්‍ය ආයතන සාධාරණ ලෙස කටයුතු කළ යුතු අතර සාකච්ඡාවේ අඩංගු දෑ සමතුලිත විය යුතු ය. යම් වැඩසටහනකට සහභාගී වන කිසියම් නියෝජිතයකුට අදාළ භාෂාවේ මනා ප්‍රවීණතාවක් නොමැති වීම හේතුවෙන් ඔහුට/ඇයට අගතියක් වන ආකාරයට වැඩසටහන් මෙහෙයවීමෙන් වැළකිය යුතු ය. මුද්‍රිත මාධ්‍ය විසින් සම්මුඛ සාකච්ඡා ලබාගෙන ප්‍රසිද්ධ කිරීමේ දී ද භාෂා ප්‍රවීණතාව නොමැති වීම නිසා සාකච්ඡාවට සහභාගි වන දේශපාලනඥයකු අපහසුතාවට පත්වන අයුරින් ක්‍රියා නොකළ යුතු ය. අපැහැදිලි හෝ තේරුම් ගැනීමට අපහසු ප්‍රශ්න හරහා ලබා ගන්නා තොරතුරු ප්‍රසිද්ධ නොකළ යුතු ය ;

14. දුරකථන මාර්ගයෙන් ප්‍රශ්න හා තොරතුරු ලබා ගනිමින් පවත්වනු ලබන වැඩ සටහන්වල දී, සියලුම අමතන්නන්ට ඔවුන්ගේ ප්‍රශ්නවල හෝ යෝජනාවල අඩංගු කරුණු කුමක් වුව ද එක හා සමාන අවස්ථා දිය යුතු ය. එමෙන්ම එවැනි වැඩසටහන්වල සමබරතාවය ගැන එම වැඩසටහන මෙහෙයවන හා සම්බන්ධ වන සියලුම නිලධාරීන් වගකිව යුතු ය.

15. කිසියම් විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක සභාපතිවරයකු, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු හෝ සේවකයකු දේශපාලන කටයුතුවල ක්‍රියාකාරීව නිරතව සිටී නම් එවැනි නිරතවීම් සමබර විකාශනයකට බාධා වන ගැටුම්වලට හේතු වේ. එබැවින් පහත සඳහන් කරුණු කළමනාකාරිත්වයේ දැන ගැනීම සඳහා අදාළ නිලධාරීන්/සේවයක් විසින් දැනුම් දිය යුතුය ;

(අ) එවැනි පුද්ගලයන්ගේ මැදිහත්වීමේ මට්ටම

(ආ) එවැනි පුද්ගලයන්ගේ රැකියාවේ ස්වභාවය හා මට්ටම

(ඇ) වැඩසටහන් සැකසීමේ දී එවැනි පුද්ගලයන්ගේ මැදිහත් වීමේ ප්‍රමාණය

16. පිළිගත් දේශපාලන පක්ෂයක ප්‍රධාන නිලයක් (නායක, සභාපති, ලේකම්, ජාතික සංවිධායක, භාණ්ඩාගාරික, නියෝජ්‍ය නායක, උප නායක, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපති හෝ ඒ සමාන බලතල ඇති) දරන තැනැත්තෙකු මාධ්‍ය ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ප්‍රධාන විධායක/ප්‍රධාන කර්තෘ වැනි ප්‍රමුඛ තනතුරක් දරන විට දී එකී තැනැත්තා ජනාධිපතිවරණ අපේක්ෂකයකු වන්නේ නම් හෝ ඔහු/ඇය ප්‍රමුඛ නිලයක් දරන පක්ෂය ඡන්ද විමසීමේ දී සෘජුවම හෝ පිළිගත් සන්ධානයකින් තරඟයට එළඹ ඇත්නම් එකී ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී ඔහු/ඇය මාධ්‍ය ආයතනයේ තනතුරේ ක්‍රියාකාරීව කටයුතු කිරීමෙන් වැළකී සිටිය යුතු ය. නැතහොත් එම මාධ්‍ය මෙහෙයවීමේ කටයුතුවලින් ක්‍රියාකාරීව කටයුතු කිරීමෙන් වැළකී සිටිය යුතුය. තව ද යම් ඡන්ද වීමසීමක දී තරඟ කරන පක්ෂයකට ප්‍රධාන නිලයක් දරන තැනැත්තෙකු හෝ ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු ලෙස තරඟ කරන තැනැත්තකු එකී ඡන්ද වීමසීම් කාලසීමාව තුළ රූපවාහිනී හෝ ගුවන් විදුලි මාධ්‍යවල දේශපාලනමය වැඩසටහන් මෙහෙයවීමෙන් වැළකී සිටිය යුතු අතර මුද්‍රිත මාධ්‍යයක නිත්‍ය සේවයේ නිතරව සිටින්නේ නම් එකී මාධ්‍ය හරහා ස්වකීය දේශපාලනමය ලිපි ප්‍රසිද්ධ කිරීමෙන් වැළකී සිටිය යුතු ය ;

17. කිසියම් මාධ්‍ය ආයතනයක් විසින් ඉදිරිපත් කරන සාකච්ඡාවකට හෝ සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වීම කිසියම් පුද්ගලයකු විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක සහ එසේ ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතු ඉදිරිපත් නොකෙරන අවස්ථාවක මාධ්‍ය ආයතනය විසින් එවැනි තත්ත්වයන්ට ගරු කළ යුතු ය. එවැනි අවස්ථාවල දී හිස් පුටුවක් ප්‍රදර්ශනය කිරීම වැනි නාට්‍ය ස්වරූප උපායක් වෙනුවට සෘජු සහ සරල නිවේදනයක් මගින් එවැන්නක් ප්‍රකාශ කිරීම යෙහෙකි.

18. මත විමසුමක ප්‍රතිඵල ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් විකාශය කිරීමේ දී හෝ මුද්‍රිත මාධ්‍යයෙන් පළ කිරීමේ දී එම මත විමසුම පවත්වන ලද සංවිධානය හඳුන්වා දීම, එම කාර්යය පවරන ලද හා ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දුන් ආයතනය හෝ තැනැත්තා භාවිතා කළ ක්‍රමය, නියැදියේ ප්‍රමාණය, දෝෂ සීමාව සහ ක්ෂේත්‍රයේ කටයුතු කළ දින වකවානු සඳහන් කළ යුතු ය. මත විමසුම පවත්වන ලද අවස්ථාවේ පැවැති මහජන මතය පමණක් මින් පිළිබිඹු වන බව විකාශක හෝ ප්‍රකාශක විසින් සඳහන් කළ යුතු ය.

19. තරඟයට එළඹ සිටින අපේක්ෂකයකු විසින් වෙනත් අපේක්ෂකයකුගේ ජයග්‍රහණය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ කරන ලද ප්‍රකාශ, විකාශය නොකළ යුතු ය. ප්‍රසිද්ධ නොකළ යුතු ය.

20. මැතිවරණ කොමසාරිස් විසින් දෙන ලද ලිඛිත අවසරයක් නොමැතිව ඡන්ද මධ්‍යස්ථානය තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථාන තුළ ඡායාරූප ගැනීම, වීඩියෝ කිරීම තහනම් කර ඇති බැවින් එසේ කිරීමෙන් වැලකී සිටීමට සියලුම මාධ්‍යවේදීන් ක්‍රියා කළ යුතු අතර, අනවසරයෙන් ලබා ගන්නා එවැනි ඡායාරූප/වීඩියෝ දර්ශන පුවත්පත්වල පළ කිරීමෙන් හෝ ඉලෙක්ට්‍රොනික් මාධ්‍යවලින් වැලකී විකාශය කිරීමෙන් වැලකී සිටිය යුතු ය.

21. ඡන්ද වීමසීම්වලට අදාළව අපේක්ෂකයකුගේ ප්‍රචාරක කටයුතුවල දී දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිපත්ති සහ පොරොන්දු පිළිබඳව ඡන්දදායකයාට මධ්‍යස්ථව සලකා බැලීමට හැකිවන පරිදි *නිහඬ වාතාවරණයක් ඡන්ද විමසන දිනට පෙර ඇති කිරීම වැදගත් වන බැවින් ජනාධිපතිවරණ ඡන්ද විමසන දිනට පෙර පැය 48ක් කාලය තුළ දී, මැතිවරණයට අදාළ සාකච්ඡා, වාද විවාද, වෙළෙඳ දැන්වීම ආදිය ප්‍රචාරය කිරීමෙන් වැළකී සිටිය යුතු ය. මුද්‍රිත මාධ්‍යයට ද මෙය අදාළ වේ.*

2015 ජනවාරි මස 08 දින පැවැත්වෙන ජනාධිපතිවරණයට අදාළ ප්‍රතිඵල නිකුත් කරන තුරු මෙම උපමානවලට අනුකූලව ක්‍රියාකිරීමෙන් එනම් එකී උපමාන පිළිපැදීමෙන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට සහාය ලබාදෙන ලෙස සියලුම මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය පාලනාධිකාරීන් වෙතින් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය

12 - 650

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.